වේරුගල් ප්‍රාදේශීය සභාව
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය
----------------------

1. මූල්‍ය ප්‍රකාශන
--------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 ජූනි 19 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 28 දින සභාපති වෙත ඉදිරිපත් කරන ලදී.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------

මෙම වාර්තාවේ 13 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට වේරුගල් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
------------------------

සභාව විසින් මූල්‍ය ප්‍රකාශන මුදල් හා උපචිත පදනම මත පිළියෙල කර තිබුණි. එනමුත්, වර්ගීකරණය සඳහා වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ උසාවි දඩ මුදල්, මුදල් හා උපචිත පදනමින් ගිණුම්වලට ගෙන තිබුණි. එනිසා විගණනයේදී ශේෂ තහවුරු කළ නොහැකි විය.

1.3.3 ගෙවිය යුතු මුදල්
----------------

එකතුව රු.47,954 ක්වූ විවිධ ණයහිමි ශේෂ හතරක් නිරවුල් නොකර පසුගිය වසර 10 ක් පුරා දිගින් දිගට ඉදිරියට ගෙනවිත් තිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොමැතිකම
--------------------------------------

රු.560,600 ක්වූ අත්තිකාරම් සහ අනෙකුත් ආයෝජන පිළිබඳ විස්තරාත්මක ලැයිස්තු පවත්වා නොතිබුණි. එනිසා එම ශේෂ විගණනයේදී තහවුරු කළ නොමැති විය.

1.3.5 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති පරිච්ඡේදය x වගන්තිය 193 | අයවැයගත සහ තත්‍ය වියදම් අතර නිරීක්ෂණය වූ විචලතා පිළිබඳ පැහැදිලි කිරීමේ ප්‍රකාශයක් පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 571 මුදල් රෙගුලාසිය | අවුරුදු 2 වැඩි, රු.215,418 ක්වූ ටෙන්ඩර් තැන්පතු, මිශ්‍ර තැන්පතු සහ රඳවුම් මුදල් නිරවුල් කිරීමට හෝ ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2016-5.4.4 වගන්තිය 1 | කොන්ත්‍රාත්කරුවන්ට අත්තිකාරම් ගෙවීමේදී කොන්ත්‍රාත්තුව සඳහා නිශ්චය කළ මුදලින් සියයට 20 ක් වූ උපරිම කාර්යසාධන බැඳුම්කරයක් ලබාගත යුතු වේ. එනමුත් ශ්‍රී ලංකා වරාය ප්‍රවේශ සෙල්ලපක්කිය මාර්ගය ඉදිකිරීම සඳහා රු.4,549,788 ක්වූ කොන්ත්‍රාත්තුව පිළිබඳ කටයුතු කරන කොන්ත්‍රාත්කරුට රු.600,000 ක අත්තිකාරමක් කාර්යසාධන බැඳුම්කරයක් ලබා නොගෙන ගෙවා තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,024,709 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,242,843 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.2,781,866 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා වූ ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුගත ආදායම, බිල්කළ ආදායම, රැස්කළ ආදායම හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු | රු. | රු. | රු. |
| (i)වරිපනම් හා බදු | 650 | 17 | 51 | - | 1 | 222 | 222 | 283 |
| (ii) කුලී | 609 | 1,130 | 1,157 | 632 | 361 | 392 | 392 | 256 |
| (iii)බලපත්‍ර ගාස්තු | 491 | - | 413 | - | 182 | - | 326 | - |
| (iv)වෙනත් ආදායම් | 3,513 | 160 | 2,899 | 1,279 | 3,169 | 140 | 2,448 | - |

### 2.2.2 මුද්දර ගාස්තු

2016 සහ 2017 වර්ෂ සඳහා වූ මුද්දර ගාස්තු ගණනය කර රෙජිස්ට්‍රාර් ජනරාල් වෙතින් අයකර ගැනීම සඳහා නිසි පරිදි කටයුතු කර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

තිරසාර සංවර්ධන ඉලක්ක

එක්සත් ජාතින්ගේ සංවිධානයේ ප්‍රධානීන් යටතේ 2015 දී පැවැත්වූ තිරසාර සංවර්ධන සමුළුවේදී තීරණය කළ 2030 තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳව සභාව දැනුවත්වී නොතිබුණි.

### 3.2 කළමනාකරණ ආකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ සිදු කෙරේ.

(අ) පළාත් මූල්‍ය රීති අංක 163.3 අනුව සියලුම අත්තිකාරම් දින 10 ක් තුළ නිරවුල් කළ යුතු වේ. එනමුත් වසර 03 සිට වසර 10 කාලයක් තිස්සේ පවතින රු.616,216 ක්වූ අත්තිකාරම් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

(ආ) ආදේශක සේවකයින්ගේ, සේවක අර්ථසාධක අරමුදලට කෙරෙන දායක මුදල් ඔවුන්ගේ දළ වැටුප් පදනම් කොට ගණනය කළ යුතු වේ. එනමුත් 2016 වසර තුළ සේවයේ යොදාගත් ආදේශක සේවකයන් තිදෙනෙකුගේ සේවක අර්ථසාධක අරමුදට දායක මුදල් සඳහා ඔවුන්ගේ මූලික වැටුප පදනම් කරගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් රු.62,719ක් අඩුවෙන් ප්‍රේෂණය කර තිබුණි. මේ දක්වාම මෙය එම අරමුදලට ප්‍රේෂණය කර නොතිබුණි.

(ඇ) ආයතන සංග්‍රහයේ XXI පරිච්ඡේදය සහ ඒ සම්බන්ධයෙන් නිකුත් කළ රාජ්‍ය පරිපාලන සහ සවදේශ කටයුතු අමාත්‍යාංශයේ 2013 අප්‍රේල් 22 දිනැති අංක ඊඑස්ටී - 8/යුඑන්අයිඑෆ්/ඕ/06/0302/6 චක්‍රලේඛයේ 2(අ) ඡේදය ප්‍රකාරව 2013 ජනවාරි 01 පටන් ක්‍රියාත්මක වන පරිදි නිල ඇඳුම් රෙදි සහ මැහුම් ගාස්තු සඳහා රියදුරන්ට සහ කාර්යාල කාර්යය සහයකයන්ට වසරකට රු.4,000 ක මුදලක් ගෙවිය යුතු වේ. එනමුත් නිල ඇඳුම් සඳහා සභාව විසින් මේ දක්වාම ගෙවීම්කර නොතිබුණි.

3.3 වත්කම් කළමනාකරණය

3.3.1 වත්කම් ලියාපදිංචි කිරීම

සභාව විසින් භාවිතා කරන පරිත්‍යාග කරනු ලැබූ වාහන 06 ක අයිතිය ලබා ගැනීම සඳහා වසර 06 ක් තිස්සේම කටයුතු කර නොතිබුණි.

3.3.2 අක්‍රීය වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ සිදු කෙරේ.

(අ) සභාවට අයත් කාමර 07 කින් සමන්විත රු.2,272,800 ක් වටිනා කඩ පේළියක් 2011 වසරේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අක්‍රීයව පැවතිණි.

(ආ) සීසෑමේ යන්ත්‍රයක්, ද්වි රෝද සීසෑමේ යන්ත්‍රයක්, මාර්ග පාලනයක් සහ ත්‍රි රෝද රථයක් වසර 04 ක් පුරා අක්‍රීයව පැවතිණි. ඒවා අලුත්වැඩියා කිරීමට හෝ වෙන්දේසියේ විකිණීමට කටයුතු කර නොතිබුණි.

3.3.3 වාර්ෂික තොග සමීක්ෂණය

සභාව විසින් පවත්වාගෙන යන පුස්තකාලයේ පොත් 602 ක ඌනතාවයක් 2017 සමීක්ෂණ මණ්ඩලය විසින් පෙන්වාදී තිබුණි. මේ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

3.4 ප්‍රසම්පාදන පරිපාටි

3.4.1 ප්‍රසම්පාදන සැලැස්ම

ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2006 මාර්තු 24 දිනැති අංක 128 චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා සභාව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

3.4.2 කොන්ත්‍රාත් පරිපාලනය

3.4.2.1 සූර්ය බල ශක්ති ලාම්පු අලුත්වැඩියා කිරීම

පුරනැගුම ව්‍යාපෘතිය යටතේ රු.7,743,120 ක් වැයකර2014 ජුනි 30 දින සවිකර තිබූ සූර්ය බලශක්ති ලාම්පු 80 ක් අක්‍රීයවී තිබුණි. එම ලාම්පු 65 ක් රු.2,731,000 ක මුදලකට අලුත්වැඩියා කිරීම සඳහා 2017 ඔක්තෝබර් 27 දින කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණි. පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) 2014 ජුලි 04 දිනැති අංක 28 දරන ප්‍රසම්පාදන පරිපාටි (අතිරේක) ප්‍රකාරව රු.2,000,000 දක්වා පමණක් සභාවට ප්‍රසම්පාදන සිදුකළ හැකියාව තිබුණි.

(ආ) අලුත්වැඩියාවෙන් පසු දිගින් දිගට නඩත්තුව සඳහා වූ වගන්තියක් මෙම කොන්ත්‍රාත්තු සඳහා වූ ගිවිසුමට ඇතුළත්කර නොතිබුණි.

(ඇ) අලුත්වැඩියා කළ ලාම්පු 65 අතරින් රු.847,400 ක් වටිනා ලාම්පු සම්පූර්ණයෙන්ම අක්‍රියව තිබූ අතර රු.892,000 ක් වටිනා ලාම්පු 20 ක් පැය කිහිපයක් සඳහා පමණක් ක්‍රියාකර තිබුණි.

3.4.2.2 ශ්‍රවනාගාරයක් ඉදි කිරීම

------------------------

පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින් ප්‍රාදේශීය සභා සවිබල ගැන්වීමට අදාල ප්‍රතිපාදන යටතේ ශ්‍රවනාගාරයක් ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව 2017 නොවැම්බර් 17 දින රු.6,749,486 ක මුදලකට පිරිනමා තිබුණි. පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) වැඩි කොන්ත්‍රාත්කරුවන් සංඛ්‍යාවක් සිටියදීත්, ජාතික මට්ටමේ තරඟකාරී මිලගණන් කැඳවීම වෙනුවට සීමිත තරඟකාරී මිලගණන් කැඳවීම සිදුකර තිබුණි. එනිසා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 1.2.1 (ඇ) මගින් අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කරගෙන නොතිබුණි.

(ආ) කොන්ත්‍රාත්කරු විසින් සිදුකළ ගණනය කිරීම් දෝෂ නිවැරදි කිරීමෙන් පසු කොන්ත්‍රාත්තු මිල රු.7,248,750 ක් වු නමුත් එය සැලකිල්ලට නොගෙන රු.6,749,486 ක මිලකට පරිනමා තිබුණි.

(ඇ) කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කළ මිල ඇස්තමේන්තුවට වඩා රු.1,793,814 කින් අඩුව තිබුණ නමුත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 7.9.11 ප්‍රකාරව කටයුතු නොකර කොන්ත්‍රාත්තුව පිරිනැමීම තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කර තිබුණි.

(ඈ) 2018 මාර්තු 23 දින වන විටත් රු.785,000 ක් වටිනා ඇස්තමේන්තු වැඩ මුළුමනින්නම ඉටු කර නොතිබුන නමුත් ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා වැඩ ඉටුකර ඇති බවට කාර්මික නිලධාරීන් විසින් සහතික කර තිබුණි.

(ඉ) 2018 ජනවාරි 12 දින වන විට නිමකල යුතු කර්මාන්ත වැඩවලින් සියයට 76 ක් 2018 ජුලි 12 දිනටත් නිමකර නොතිබීම නිසා, රු.674,948 ක්වු ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

--------------------------------------

4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

----------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 ජුනි 19 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.

4.2 අයවැය පාලනය

---------------------

අයැවය සහ තත්‍ය වියදම් අතර සියයට 8 සිට 93 දක්වා විචලනයක් පෙන්නුම් කළ නිසා අයවැය කාර්යක්ෂම කළමනාකරණ පාලනයක් වශයෙන් උපයෝගී කර ගෙන නොතිබුණි. තවද, සභා ප්‍රදේශය තුළ තක්සේරු කිරීම් සිදුකර නොතිබු නමුත් රු.650,000 ක්වු තක්සේරු බද්දක් ඇස්තමේන්තුකර තිබුණි.

5. පද්ධති හා පාලන

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර වෙනුවෙන් විශේෂ අවධානය අවශ්‍ය වේ.

| පද්ධති හා පාලන | | අවධානය අවශ්‍ය කරුණු |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | i. ලෙජර යාවත්කාලීනව පැවැත්වීම.<br>ii. වියදම් ස්වරූපය අනුව වත්කම් වර්ගීකරණය කිරීම<br>iii. ණයගැති හා ණයහිමි ලේඛන නඩත්තුව. |
| (ආ) | ස්ථාවර වත්කම් පාලනය | i. ස්ථාවර වත්කම් ලේඛන නඩත්තු කිරීම.<br>ii. ගබඩා ලේඛනය විධිමත්ව නඩත්තු කිරීම |
| (ඇ) | ආදායම් පරිපාලනය | හිඟ ආදායම් අයකර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |
| (ඈ) | කොන්ත්‍රාත් පරිපාලනය | කොන්ත්‍රාත්තු පිරිනැමීමේදී ප්‍රසම්පාදන චක්‍ර ලේඛවලට අනුකූලව කටයුතු කළ යුතුය. |